**කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි සිව්වන වසර පරීක්ෂණය (බාහිර)-2023

2026 - මාර්තු

**BCOM E 4025 - මූල්‍ය ගිණුම්කරණය**

මුළු ප්‍රශ්න සංඛ්‍යාව හතයි : (07) කාලය : පැය 03 යි

පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

**ප්‍රශ්න අංක 01**

අ) i. මූල්‍ය කළමනාකරණයේදී සමාගමක මූලික මූල්‍ය කළමනාකරණ අරමුණ විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

(ලකුණු 04)

ii. මෙම අරමුණ සාක්ෂාත් කර ගෙන ඇත්දැයි සමාගමකට ඇගයීමට ලක් කළ හැකි ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ආ) මූල්‍ය කළමනාකරණ තීරණ ව්‍යාපාරයක දිගුකාලීන සාර්ථකත්වයට සහ වටිනාකමට බලපාන ආකාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 02**

අ) මුදලේ කාල වටිනාකම යනු කුමක්ද? එය වැදගත් වන්නේ ඇයි.

(ලකුණු 02)

ආ) මූල්‍ය තීරණ ගැනීමේදී ඒවා භාවිතා කරන ආකාරය නිරූපණය කරමින් තනි මුදල් ප්‍රවාහ සහ වාර්ෂික දෘෂ්ටිකෝණයෙන් මුදලේ කාල වටිනාකම පිළිබඳ සංකල්පය පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ඇ) බැංකුවක් ආයෝජන විකල්ප දෙකක් ඉදිරිපත් කරයි. පළමු විකල්පය වාර්ෂිකව 12% ක වාර්ෂික සංයෝග පොලියක් ලබා දෙන අතර, දෙවන විකල්පය මාසිකව 12% ක වාර්ෂික සංයෝග පොලියක් ලබාදීමයි.

i. ඔබ කැමති කුමන විකල්පයද?

(ලකුණු 02)

ii. සුදුසු ගණනය කිරීම් භාවිතා කරමින්, විකල්ප දෙකෙහිම ඵලදායී වාර්ෂික ප්‍රතිලාභ සංසන්දනය කර ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න.

(ලකුණු 04)

ඇ) චාමර මහතාට වයස අවුරුදු 30 ක් වන අතර වයස අවුරුදු 55 දී විශ්‍රාම යාමට සැලසුම් කරයි. විශ්‍රාම යන විට රු. 20,000,000 ක් ඉතිරි කර ගැනීමට ඔහුට අවශ්‍ය වේ. වාර්ෂික පොලිය 12% ක් ගෙවන බැංකු ගිණුමක සමාන මුදල් තැන්පත් කිරීමට ඔහු සැලසුම් කරයි.

i. සෑම වසරකම අවසානයේ තැන්පතු සිදු කරන්නේ නම් අවශ්‍ය වාර්ෂික ඉතිරිකිරීම් ගණනය කරන්න.

(ලකුණු 02)

ii. සෑම වසරකම ආරම්භයේදී තැන්පතු සිදු කරන්නේ නම් අවශ්‍ය වාර්ෂික ඉතිරිකිරීම් ගණනය කරන්න.

(ලකුණු 02)

iii. සෑම මසකම අවසානයේ තැන්පතු සිදු කරන්නේ නම් අවශ්‍ය මාසික ඉතිරිකිරීම් ගණනය කරන්න.

(ලකුණු 02)

iv. සෑම මසකම ආරම්භයේදී තැන්පතු සිදු කරන්නේ නම් අවශ්‍ය මාසික ඉතිරිකිරීම් ගණනය කරන්න.

(ලකුණු 02)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 03**

අ) පහත සංකල්ප කෙටියෙන් පැහැදිලි කර මූල්‍ය තීරණ ගැනීමේදී එය වැදගත් වන්නේ මන්දැයි සඳහන් කරන්න.

i. සුරැකුම්පත් අගයකිරීම

(ලකුණු 02)

ii. ප්‍රාග්ධන පිරිවැය

(ලකුණු 02)

ආ) ෂෙයින් සමාගම යනු සාමාන්‍ය කොටස් 200,000ක් නිකුත් කර ඇති ලැයිස්තුගත සමාගමකි. ඊට අමතරව, සමාගම වසරකට 20%ක ස්ථාවර ලාභාංශ අනුපාතයක් සහිත කොටසකට රු. 100ක මුහුණත වටිනාකමක් සහිත පරිනත නොවන වරණීය කොටස් 100,000ක් නිකුත් කර ඇත. වරණීය කොටස් සඳහා ප්‍රාග්ධන පිරිවැය 12% කි.

සමාගමේ ප්‍රාග්ධන ව්‍යුහය සාමාන්‍ය කොටස් 60%ක්, වරණීය කොටස් 20%ක් සහ ණය 20%කින් සමන්විත වේ. ෂෙයින් සමාගම සාමාන්‍ය කොටසකට රු. 10ක ලාභාංශයක් ගෙවා ඇති අතර, ඉදිරි වසර දෙක සඳහා ලාභාංශ වාර්ෂිකව 20%කින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කරන අතර, ඉන් පසුව දීර්ග කාලීනව ලාභාංශ 10%ක ස්ථාවර වර්ධන වේගයකින් වර්ධනය වේ යයි අදහස් කරයි, මේ සඳහා ප්‍රාග්ධන පිරිවැය 15%කි.

ෂෙයින් සමාගම විසින් රු. 200ක මුහුණත වටිනාකමක් සහිත වසර 10ක බැඳුම්කර ද නිකුත් කර ඇති අතර, එය 15%ක වාර්ෂික කූපන අනුපාතයක් ගෙවයි . ණය ප්‍රාග්ධන පිරිවැය 10%කි. අදාළ ආයතනික බදු අනුපාතය 30%කි.

i. සුදුසු ලාභාංශ තක්සේරුකරණ ආකෘතියක් භාවිතා කරමින් ෂෙයින් සමාගමහි සාමාන්‍ය කොටසක වටිනාකම ගණනය කරන්න.

(ලකුණු 04)

ii. ලබා දී ඇති 12% ප්‍රාග්ධන පිරිවැය භාවිතා කරමින් වරණීය කොටසක වටිනාකම ගණනය කරන්න

(ලකුණු 03)

iii. ෂෙයින් සමාගමේ බැදුම්කරයක නෛසර්ගික වටිනාකම ගණනය කරන්න.

(ලකුණු 03)

iv. ෂෙයින් සමාගමහි ණය සඳහා බදු පසු ප්‍රාග්ධන පිරිවැය ගණනය කරන්න

(ලකුණු 03)

v. ෂෙයින් සමාගම සඳහා බරිත සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැය ගණනය කරන්න

(ලකුණු 03)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක. 04**

අ) ආයෝජන තීරණ ගැනීමේදී ආයෝජකයින්ට මූල්‍ය ප්‍රකාශන විශ්ලේෂණය කිරීම වැදගත් වන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ආ) මූල්‍ය ප්‍රකාශන විවිධ ශිල්පීය ක්‍රම භාවිතයෙන් විශ්ලේෂණය කළ හැකිය. පහත ක්‍රම කෙටියෙන් පැහැදිලි කරන්න:

i. තිරස් විශ්ලේෂණය
ii. සිරස් විශ්ලේෂණය
iii. අනුපාත විශ්ලේෂණය

(ලකුණු 02x03)

ඇ) 2025 මාර්තු 31 සහ 2024 දිනෙන් අවසන් වූ වසර සඳහා සියටා පීඑල්සී හි ආදායම් ප්‍රකාශයෙන් සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙන් උපුටා ගැනීම් පහත දැක්වේ.

සියටා පීඑල්සී

මාර්තු 31න අවසන් වසර සඳහා

ආදායම් ප්‍රකාශය

| | 2025 | 2024 |
|---|---|---|
| විකුණුම් | 198,800 | 164,325 |
| විකුණුම් පිරිවැය | (158,550) | (134,400) |
| දළ ලාභය | 40,250 | 29,925 |
| මෙහෙයුම් වියදම් | (18,970) | (14,700) |
| මෙහෙයුම් ලාභය | 21,280 | 15,225 |
| වෙනත් ආදායම් | 4,025 | 3115 |
| පොලී වියදම | (2975) | (2240) |
| බදු පෙර ලාභය | 22,330 | 16,100 |
| බදු | (6,545) | (4,550) |
| බදු පසු ලාභය | 28,875 | 20,650 |

සියටා පීඑල්සී

මාර්තු 31 දිනට

මුල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | **2025** | **2024** |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | |
| ජංගම නොවන වත්කම් | 54,600 | 35,700 |
| ආයෝජන | 22,750 | 3,675 |
| **ජංගම වත්කම්** | | |
| තොගය | 2,030 | 1,365 |
| ණය ගැතියන් | 18,270 | 14,525 |
| අනෙකුත් ජංගම වත්කම් | 9,240 | 6,265 |
| අතැති හා බැංකු මුදල් | 18,550 | 16,975 |
| **මුළු වත්කම්** | **125,440** | **78,505** |
| | | |
| **ප්‍රාග්ධනය හා වගකීම්** | | |
| ප්‍රාග්ධනය | 37,625 | 23,800 |
| රඳවාගත් ඉපැයුම් | 23,100 | 7,525 |
| දිගු කාලීන ණය | 3,220 | 2,240 |
| **ජංගම වගකීම්** | | |
| ණය හිමියෝ | 36,575 | 28,175 |
| ගෙවිය යුතු දෑ | 24,920 | 16,765 |
| **මුළු ප්‍රාග්ධනය හා වගකීම්** | **125,440** | **78,505** |

ඉහත සපයා ඇති තොරතුරු භාවිතා කර 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පහත අනුපාත ගණනය කරන්න

i. ජංගම අනුපාතය

ii ක්ෂණික අනුපාතය

iv. දළ ලාභ අනුපාතය

iv. ශුද්ධ ලාභ අනුපාතය

v. තොග පිරිවැටුම් අනුපාතය

(ලකුණු 2X5)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 05**

අ) ප්‍රාග්ධන ව්‍යුහය පිළිබඳ සංකල්පය පැහැදිලි කරන්න

(ලකුණු 03)

ආ) සමාගමක් එහි ප්‍රාග්ධන ව්‍යුහයේ ණය සහ කොටස් මිශ්‍රණය තීරණය කිරීමේදී සලකා බැලිය යුතු සාධක පැහැදිලි කරන්න

(ලකුණු 03)

ඇ) A සහ B යන කොටස් දෙකකට අදාල අපේක්ෂිත අනාගත ප්‍රතිලාභ හා සම්භාවිතා ව්‍යාප්ති පහත දී ඇත.

| සම්භාවිතාව | A කොටස් ප්‍රතිලාභ | B කොටස් ප්‍රතිලාභ |
|---|---|---|
| 0.1 | 8% | 30% |
| 0.25 | 5% | 10% |
| 0.3 | 15% | 22% |
| 0.2 | 25% | 28% |
| 0.15 | 40% | 50% |

ඉහත දත්ත භාවිතා කරමින්, කොටස් දෙක සඳහා

i. අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය සහ සම්මත අපගමනය ගණනය කරන්න

(ලකුණු 05)

ii. ගණනය කළ ප්‍රතිඵල මත පදනම්ව, අවදානම් වන කොටස කුමක්දැයි හඳුනාගෙන ඔබේ පිළිතුර කෙටියෙන් සාධාරණීකරණය කරන්න.

(ලකුණු 02)

ඈ) ආයෝජකයෙකු තම ආයෝජන කළඹෙන් 60% ක් ඇල්ෆා හෝල්ඩින්ග්ස් පීඑල්සීත් ඉතිරි 40% නෝවා ඉන්ඩස්ට්‍රීස් පීඑල්සී හි ආයෝජනය කර ඇත. ආයෝජන කළඹෙහි බීටා අගය 0.8 ක් වන අතර, කොටස් දෙක ධනාත්මකව සහසම්බන්ධ වේ. පහත තොරතුරු සපයා ඇත:

- ඇල්ෆා හෝල්ඩින්ග්ස් පීඑල්සී ($ER_a$) හි අපේක්ෂිත ප්‍රතිලාභය = 14%
- නෝවා ඉන්ඩස්ට්‍රීස් පීඑල්සී ($ER_n$) හි අපේක්ෂිත ප්‍රතිලාභය = 10%
- ඇල්ෆා හෝල්ඩින්ග්ස් පීඑල්සී ($\sigma_a$) හි සම්මත අපගමනය = 22%
- නෝවා ඉන්ඩස්ට්‍රීස් පීඑල්සී ($\sigma_n$) හි සම්මත අපගමනය = 16%

ඉහත දත්ත භාවිතා කරමින්,

i. ආයෝජන කළඹේ ප්‍රතිලාභය

(ලකුණු 03)

ii. ආයෝජන කළඹේ සම්මත අපගමනය (අවදානම) ගණනය කරන්න.

(ලකුණු 04)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක **06**

අ) ව්‍යාපාරයක දිගුකාලීන සාර්ථකත්වය සඳහා ප්‍රාග්ධන අයවැයකරණ තීරණ වැදගත් වන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 03)

ආ) ආයෝජන තීරණ ගැනීමේදී පහත සඳහන් ප්‍රාග්ධන අයවැයකරණ ශිල්පීය ක්‍රම සහ ඒවායේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න:

i ශුද්ධ වර්තමාන වටිනාකම (NPV)

ii. අභ්‍යන්තර ප්‍රතිලාභ අනුපාතය (IRR)

iii පිළිගේවුම් කාලය

( ලකුණු 3x2)

ඇ) ග්‍රීන්ටෙක් මැනුෆැක්චරින් (පුද්ගලික) සමාගම එහි නිෂ්පාදන කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා නව යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමට සැලසුම් කරයි. සමාගම විකල්ප දෙකක් ඇගයීමට ලක් කරයි: යන්ත්‍ර A සහ යන්ත්‍ර B. එක් එක් යන්ත්‍රයෙන් අපේක්ෂිත ශුද්ධ මුදල් ප්‍රවාහ පහත දක්වා ඇත. සමාගමේ ප්‍රාග්ධන පිරිවැය 10% කි.

| **යන්ත්‍රය A මුදල් ප්‍රවාහ** | | **යන්ත්‍රය B මුදල් ප්‍රවාහ** | |
|---|---|---|---|
| වසර | මුදල් ප්‍රවාහ | වසර | මුදල් ප්‍රවාහ |
| 0 | (160,000) | 0 | (140,000) |
| 1 | 50,000 | 1 | 40,000 |
| 2 | 60,000 | 2 | 50,000 |
| 3 | 75,000 | 3 | 60,000 |
| 4 | 85,000 | 4 | 70,000 |
| 5 | 95,000 | 5 | 100,000 |

ඉහත දත්ත භාවිතා කරමින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. යන්ත්‍ර දෙකටම පිළිගෙවුම් කාලය ගණනය කරන්න.

(ලකුණු 03)

ii. යන්ත්‍ර දෙකටම ශුද්ධ වර්තමාන අගය (NPV) ගණනය කරන්න.

(ලකුණු 06)

iii. ඔබේ ගණනය කිරීම් මත පදනම්ව, සමාගම තෝරා ගත යුත්තේ කුමන යන්ත්‍රයද? ඔබේ පිළිතුර කෙටියෙන් සාධාරණීකරණය කරන්න

(ලකුණු 02)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක **07**

අ) "ඕනෑම සමාගමකට කාරක ප්‍රාග්ධන තීරණ ඉතා වැදගත්" ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟද? කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ආ) "ගැමා පීඑල්සී" හි මුදල් පරිවර්තන චක්‍රය දින 110 කි. විකිණීමට පෙර, සමාගම ඔවුන්ගේ තොග දින 52 ක් ගබඩා කරන අතර ඔවුන් තම ණයහිමියන්ට ගෙවීමට දින 33 ක් ගතවේ. ගැමා පීඑල්සී හි සාමාන්‍ය එකතු කිරීමේ කාලය ගණනය කිරනන

(ලකුණු 04)

ඇ) "සමහර ආයෝජකයින් වත්මන් ලාභාංශ ලබා ගැනීමට කැමැත්තක් දක්වන අතර අනෙක් අය එසේ නොකරයි. ඒ හා සමානව, සමහර සමාගම් ලාභාංශ ප්‍රකාශ කිරීමට තෝරා ගන්නා අතර අනෙක් අය විවිධ හේතූන් මත එසේ කිරීමෙන් වැළකී සිටිති." ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න

(ලකුණු 06)

ඇ) "ලාභාංශයක් යනු සමාගමක ශුද්ධ ලාභයෙන් කොටසක් එහි කොටස් හිමියන්ට බෙදා හැරීමයි. ලැබේ. ලාභාංශ ප්‍රතිපත්තිය සමාගමක වටිනාකමට බලපාන ආකාරය පිළිබඳ පරස්පර අදහස් ඇති බැවින්, මූල්‍ය කළමනාකරණයේදී ලාභාංශ තීරණ තීරණාත්මක ලෙස සැලකේ."
අදාළ ලාභාංශ න්‍යායන් ඇසුරෙන් ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 06)
(මුළු ලකුණු 20)

## Present Value and Future Value Tables

### Table A-3 Present Value Interest Factors for One Dollar Discounted at $k$ Percent for $n$ Periods: $PVIF_{k,n} = 1 / (1 + k)^n$

| Period | 1% | 2% | 3% | 4% | 5% | 6% | 7% | 8% | 9% | 10% | 11% | 12% | 13% | 14% | 15% | 16% | 20% | 24% | 25% | 30% |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 0.9901 | 0.9804 | 0.9709 | 0.9615 | 0.9524 | 0.9434 | 0.9346 | 0.9259 | 0.9174 | 0.9091 | 0.9009 | 0.8929 | 0.8850 | 0.8772 | 0.8696 | 0.8621 | 0.8333 | 0.8065 | 0.8000 | 0.7692 |
| 2 | 0.9803 | 0.9612 | 0.9426 | 0.9246 | 0.9070 | 0.8900 | 0.8734 | 0.8573 | 0.8417 | 0.8264 | 0.8116 | 0.7972 | 0.7831 | 0.7695 | 0.7561 | 0.7432 | 0.6944 | 0.6504 | 0.6400 | 0.5917 |
| 3 | 0.9706 | 0.9423 | 0.9151 | 0.8890 | 0.8638 | 0.8396 | 0.8163 | 0.7938 | 0.7722 | 0.7513 | 0.7312 | 0.7118 | 0.6931 | 0.6750 | 0.6575 | 0.6407 | 0.5787 | 0.5245 | 0.5120 | 0.4552 |
| 4 | 0.9610 | 0.9238 | 0.8885 | 0.8548 | 0.8227 | 0.7921 | 0.7629 | 0.7350 | 0.7084 | 0.6830 | 0.6587 | 0.6355 | 0.6133 | 0.5921 | 0.5718 | 0.5523 | 0.4823 | 0.4230 | 0.4096 | 0.3501 |
| 5 | 0.9515 | 0.9057 | 0.8626 | 0.8219 | 0.7835 | 0.7473 | 0.7130 | 0.6806 | 0.6499 | 0.6209 | 0.5935 | 0.5674 | 0.5428 | 0.5194 | 0.4972 | 0.4761 | 0.4019 | 0.3411 | 0.3277 | 0.2693 |
| 6 | 0.9420 | 0.8880 | 0.8375 | 0.7903 | 0.7462 | 0.7050 | 0.6663 | 0.6302 | 0.5963 | 0.5645 | 0.5346 | 0.5066 | 0.4803 | 0.4556 | 0.4323 | 0.4104 | 0.3349 | 0.2751 | 0.2621 | 0.2072 |
| 7 | 0.9327 | 0.8706 | 0.8131 | 0.7599 | 0.7107 | 0.6651 | 0.6227 | 0.5835 | 0.5470 | 0.5132 | 0.4817 | 0.4523 | 0.4251 | 0.3996 | 0.3759 | 0.3538 | 0.2791 | 0.2218 | 0.2097 | 0.1594 |
| 8 | 0.9235 | 0.8535 | 0.7894 | 0.7307 | 0.6768 | 0.6274 | 0.5820 | 0.5403 | 0.5019 | 0.4665 | 0.4339 | 0.4039 | 0.3762 | 0.3506 | 0.3269 | 0.3050 | 0.2326 | 0.1789 | 0.1678 | 0.1226 |
| 9 | 0.9143 | 0.8368 | 0.7664 | 0.7026 | 0.6446 | 0.5919 | 0.5439 | 0.5002 | 0.4604 | 0.4241 | 0.3909 | 0.3606 | 0.3329 | 0.3075 | 0.2843 | 0.2630 | 0.1938 | 0.1443 | 0.1342 | 0.0943 |
| 10 | 0.9053 | 0.8203 | 0.7441 | 0.6756 | 0.6139 | 0.5584 | 0.5083 | 0.4632 | 0.4224 | 0.3855 | 0.3522 | 0.3220 | 0.2946 | 0.2697 | 0.2472 | 0.2267 | 0.1615 | 0.1164 | 0.1074 | 0.0725 |
| 11 | 0.8963 | 0.8043 | 0.7224 | 0.6496 | 0.5847 | 0.5268 | 0.4751 | 0.4289 | 0.3875 | 0.3505 | 0.3173 | 0.2875 | 0.2607 | 0.2366 | 0.2149 | 0.1954 | 0.1346 | 0.0938 | 0.0859 | 0.0558 |
| 12 | 0.8874 | 0.7885 | 0.7014 | 0.6246 | 0.5568 | 0.4970 | 0.4440 | 0.3971 | 0.3555 | 0.3186 | 0.2858 | 0.2567 | 0.2307 | 0.2076 | 0.1869 | 0.1685 | 0.1122 | 0.0757 | 0.0687 | 0.0429 |
| 13 | 0.8787 | 0.7730 | 0.6810 | 0.6006 | 0.5303 | 0.4688 | 0.4150 | 0.3677 | 0.3262 | 0.2897 | 0.2575 | 0.2292 | 0.2042 | 0.1821 | 0.1625 | 0.1452 | 0.0935 | 0.0610 | 0.0550 | 0.0330 |
| 14 | 0.8700 | 0.7579 | 0.6611 | 0.5775 | 0.5051 | 0.4423 | 0.3878 | 0.3405 | 0.2992 | 0.2633 | 0.2320 | 0.2046 | 0.1807 | 0.1597 | 0.1413 | 0.1252 | 0.0779 | 0.0492 | 0.0440 | 0.0254 |
| 15 | 0.8613 | 0.7430 | 0.6419 | 0.5553 | 0.4810 | 0.4173 | 0.3624 | 0.3152 | 0.2745 | 0.2394 | 0.2090 | 0.1827 | 0.1599 | 0.1401 | 0.1229 | 0.1079 | 0.0649 | 0.0397 | 0.0352 | 0.0195 |
| 16 | 0.8528 | 0.7284 | 0.6232 | 0.5339 | 0.4581 | 0.3936 | 0.3387 | 0.2919 | 0.2519 | 0.2176 | 0.1883 | 0.1631 | 0.1415 | 0.1229 | 0.1069 | 0.0930 | 0.0541 | 0.0320 | 0.0281 | 0.0150 |
| 17 | 0.8444 | 0.7142 | 0.6050 | 0.5134 | 0.4363 | 0.3714 | 0.3166 | 0.2703 | 0.2311 | 0.1978 | 0.1696 | 0.1456 | 0.1252 | 0.1078 | 0.0929 | 0.0802 | 0.0451 | 0.0258 | 0.0225 | 0.0116 |
| 18 | 0.8360 | 0.7002 | 0.5874 | 0.4936 | 0.4155 | 0.3503 | 0.2959 | 0.2502 | 0.2120 | 0.1799 | 0.1528 | 0.1300 | 0.1108 | 0.0946 | 0.0808 | 0.0691 | 0.0376 | 0.0208 | 0.0180 | 0.0089 |
| 19 | 0.8277 | 0.6864 | 0.5703 | 0.4746 | 0.3957 | 0.3305 | 0.2765 | 0.2317 | 0.1945 | 0.1635 | 0.1377 | 0.1161 | 0.0981 | 0.0829 | 0.0703 | 0.0596 | 0.0313 | 0.0168 | 0.0144 | 0.0068 |
| 20 | 0.8195 | 0.6730 | 0.5537 | 0.4564 | 0.3769 | 0.3118 | 0.2584 | 0.2145 | 0.1784 | 0.1486 | 0.1240 | 0.1037 | 0.0868 | 0.0728 | 0.0611 | 0.0514 | 0.0261 | 0.0135 | 0.0115 | 0.0053 |
| 21 | 0.8114 | 0.6598 | 0.5375 | 0.4388 | 0.3589 | 0.2942 | 0.2415 | 0.1987 | 0.1637 | 0.1351 | 0.1117 | 0.0926 | 0.0768 | 0.0638 | 0.0531 | 0.0443 | 0.0217 | 0.0109 | 0.0092 | 0.0040 |
| 22 | 0.8034 | 0.6468 | 0.5219 | 0.4220 | 0.3418 | 0.2775 | 0.2257 | 0.1839 | 0.1502 | 0.1228 | 0.1007 | 0.0826 | 0.0680 | 0.0560 | 0.0462 | 0.0382 | 0.0181 | 0.0088 | 0.0074 | 0.0031 |
| 23 | 0.7954 | 0.6342 | 0.5067 | 0.4057 | 0.3256 | 0.2618 | 0.2109 | 0.1703 | 0.1378 | 0.1117 | 0.0907 | 0.0738 | 0.0601 | 0.0491 | 0.0402 | 0.0329 | 0.0151 | 0.0071 | 0.0059 | 0.0024 |
| 24 | 0.7876 | 0.6217 | 0.4919 | 0.3901 | 0.3101 | 0.2470 | 0.1971 | 0.1577 | 0.1264 | 0.1015 | 0.0817 | 0.0659 | 0.0532 | 0.0431 | 0.0349 | 0.0284 | 0.0126 | 0.0057 | 0.0047 | 0.0018 |
| 25 | 0.7798 | 0.6095 | 0.4776 | 0.3751 | 0.2953 | 0.2330 | 0.1842 | 0.1460 | 0.1160 | 0.0923 | 0.0736 | 0.0588 | 0.0471 | 0.0378 | 0.0304 | 0.0245 | 0.0105 | 0.0046 | 0.0038 | 0.0014 |
| 30 | 0.7419 | 0.5521 | 0.4120 | 0.3083 | 0.2314 | 0.1741 | 0.1314 | 0.0994 | 0.0754 | 0.0573 | 0.0437 | 0.0334 | 0.0256 | 0.0196 | 0.0151 | 0.0116 | 0.0042 | 0.0016 | 0.0012 | * |
| 35 | 0.7059 | 0.5000 | 0.3554 | 0.2534 | 0.1813 | 0.1301 | 0.0937 | 0.0676 | 0.0490 | 0.0356 | 0.0259 | 0.0189 | 0.0139 | 0.0102 | 0.0075 | 0.0055 | 0.0017 | 0.0005 | * | * |
| 36 | 0.6989 | 0.4902 | 0.3450 | 0.2437 | 0.1727 | 0.1227 | 0.0875 | 0.0626 | 0.0449 | 0.0323 | 0.0234 | 0.0169 | 0.0123 | 0.0089 | 0.0065 | 0.0048 | 0.0014 | * | * | * |
| 40 | 0.6717 | 0.4529 | 0.3066 | 0.2083 | 0.1420 | 0.0972 | 0.0668 | 0.0460 | 0.0318 | 0.0221 | 0.0154 | 0.0107 | 0.0075 | 0.0053 | 0.0037 | 0.0026 | 0.0007 | * | * | * |
| 50 | 0.6080 | 0.3715 | 0.2281 | 0.1407 | 0.0872 | 0.0543 | 0.0339 | 0.0213 | 0.0134 | 0.0085 | 0.0054 | 0.0035 | 0.0022 | 0.0014 | 0.0009 | 0.0006 | * | * | * | * |

### Table A-4 Present Value Interest Factors for a One-Dollar Annuity Discounted at $k$ Percent for $n$ Periods: $PVIFA = [1 - 1/(1 + k)^n] / k$

| Period | 1% | 2% | 3% | 4% | 5% | 6% | 7% | 8% | 9% | 10% | 11% | 12% | 13% | 14% | 15% | 16% | 20% | 24% | 25% | 30% |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 0.9901 | 0.9804 | 0.9709 | 0.9615 | 0.9524 | 0.9434 | 0.9346 | 0.9259 | 0.9174 | 0.9091 | 0.9009 | 0.8929 | 0.8850 | 0.8772 | 0.8696 | 0.8621 | 0.8333 | 0.8065 | 0.8000 | 0.7692 |
| 2 | 1.9704 | 1.9416 | 1.9135 | 1.8861 | 1.8594 | 1.8334 | 1.8080 | 1.7833 | 1.7591 | 1.7355 | 1.7125 | 1.6901 | 1.6681 | 1.6467 | 1.6257 | 1.6052 | 1.5278 | 1.4568 | 1.4400 | 1.3609 |
| 3 | 2.9410 | 2.8839 | 2.8286 | 2.7751 | 2.7232 | 2.6730 | 2.6243 | 2.5771 | 2.5313 | 2.4869 | 2.4437 | 2.4018 | 2.3612 | 2.3216 | 2.2832 | 2.2459 | 2.1065 | 1.9813 | 1.9520 | 1.8161 |
| 4 | 3.9020 | 3.8077 | 3.7171 | 3.6299 | 3.5460 | 3.4651 | 3.3872 | 3.3121 | 3.2397 | 3.1699 | 3.1024 | 3.0373 | 2.9745 | 2.9137 | 2.8550 | 2.7982 | 2.5887 | 2.4043 | 2.3616 | 2.1662 |
| 5 | 4.8534 | 4.7135 | 4.5797 | 4.4518 | 4.3295 | 4.2124 | 4.1002 | 3.9927 | 3.8897 | 3.7908 | 3.6959 | 3.6048 | 3.5172 | 3.4331 | 3.3522 | 3.2743 | 2.9906 | 2.7454 | 2.6893 | 2.4356 |
| 6 | 5.7955 | 5.6014 | 5.4172 | 5.2421 | 5.0757 | 4.9173 | 4.7665 | 4.6229 | 4.4859 | 4.3553 | 4.2305 | 4.1114 | 3.9975 | 3.8887 | 3.7845 | 3.6847 | 3.3255 | 3.0205 | 2.9514 | 2.6427 |
| 7 | 6.7282 | 6.4720 | 6.2303 | 6.0021 | 5.7864 | 5.5824 | 5.3893 | 5.2064 | 5.0330 | 4.8684 | 4.7122 | 4.5638 | 4.4226 | 4.2883 | 4.1604 | 4.0386 | 3.6046 | 3.2423 | 3.1611 | 2.8021 |
| 8 | 7.6517 | 7.3255 | 7.0197 | 6.7327 | 6.4632 | 6.2098 | 5.9713 | 5.7466 | 5.5348 | 5.3349 | 5.1461 | 4.9676 | 4.7988 | 4.6389 | 4.4873 | 4.3436 | 3.8372 | 3.4212 | 3.3289 | 2.9247 |
| 9 | 8.5660 | 8.1622 | 7.7861 | 7.4353 | 7.1078 | 6.8017 | 6.5152 | 6.2469 | 5.9952 | 5.7590 | 5.5370 | 5.3282 | 5.1317 | 4.9464 | 4.7716 | 4.6065 | 4.0310 | 3.5655 | 3.4631 | 3.0190 |
| 10 | 9.4713 | 8.9826 | 8.5302 | 8.1109 | 7.7217 | 7.3601 | 7.0236 | 6.7101 | 6.4177 | 6.1446 | 5.8892 | 5.6502 | 5.4262 | 5.2161 | 5.0188 | 4.8332 | 4.1925 | 3.6819 | 3.5705 | 3.0915 |
| 11 | 10.368 | 9.7868 | 9.2526 | 8.7605 | 8.3064 | 7.8869 | 7.4987 | 7.1390 | 6.8052 | 6.4951 | 6.2065 | 5.9377 | 5.6869 | 5.4527 | 5.2337 | 5.0286 | 4.3271 | 3.7757 | 3.6564 | 3.1473 |
| 12 | 11.255 | 10.575 | 9.9540 | 9.3851 | 8.8633 | 8.3838 | 7.9427 | 7.5361 | 7.1607 | 6.8137 | 6.4924 | 6.1944 | 5.9176 | 5.6603 | 5.4206 | 5.1971 | 4.4392 | 3.8514 | 3.7251 | 3.1903 |
| 13 | 12.134 | 11.348 | 10.635 | 9.9856 | 9.3936 | 8.8527 | 8.3577 | 7.9038 | 7.4869 | 7.1034 | 6.7499 | 6.4235 | 6.1218 | 5.8424 | 5.5831 | 5.3423 | 4.5327 | 3.9124 | 3.7801 | 3.2233 |
| 14 | 13.004 | 12.106 | 11.296 | 10.563 | 9.8986 | 9.2950 | 8.7455 | 8.2442 | 7.7862 | 7.3667 | 6.9819 | 6.6282 | 6.3025 | 6.0021 | 5.7245 | 5.4675 | 4.6106 | 3.9616 | 3.8241 | 3.2487 |
| 15 | 13.865 | 12.849 | 11.938 | 11.118 | 10.380 | 9.7122 | 9.1079 | 8.5595 | 8.0607 | 7.6061 | 7.1909 | 6.8109 | 6.4624 | 6.1422 | 5.8474 | 5.5755 | 4.6755 | 4.0013 | 3.8593 | 3.2682 |
| 16 | 14.718 | 13.578 | 12.561 | 11.652 | 10.838 | 10.106 | 9.4466 | 8.8514 | 8.3126 | 7.8237 | 7.3792 | 6.9740 | 6.6039 | 6.2651 | 5.9542 | 5.6685 | 4.7296 | 4.0333 | 3.8874 | 3.2832 |
| 17 | 15.562 | 14.292 | 13.166 | 12.166 | 11.274 | 10.477 | 9.7632 | 9.1216 | 8.5436 | 8.0216 | 7.5488 | 7.1196 | 6.7291 | 6.3729 | 6.0472 | 5.7487 | 4.7746 | 4.0591 | 3.9099 | 3.2948 |
| 18 | 16.398 | 14.992 | 13.754 | 12.659 | 11.690 | 10.828 | 10.059 | 9.3719 | 8.7556 | 8.2014 | 7.7016 | 7.2497 | 6.8399 | 6.4674 | 6.1280 | 5.8178 | 4.8122 | 4.0799 | 3.9279 | 3.3037 |
| 19 | 17.226 | 15.678 | 14.324 | 13.134 | 12.085 | 11.158 | 10.336 | 9.6036 | 8.9501 | 8.3649 | 7.8393 | 7.3658 | 6.9380 | 6.5504 | 6.1982 | 5.8775 | 4.8435 | 4.0967 | 3.9424 | 3.3105 |
| 20 | 18.046 | 16.351 | 14.877 | 13.590 | 12.462 | 11.470 | 10.594 | 9.8181 | 9.1285 | 8.5136 | 7.9633 | 7.4694 | 7.0248 | 6.6231 | 6.2593 | 5.9288 | 4.8696 | 4.1103 | 3.9539 | 3.3158 |
| 21 | 18.857 | 17.011 | 15.415 | 14.029 | 12.821 | 11.764 | 10.836 | 10.017 | 9.2922 | 8.6487 | 8.0751 | 7.5620 | 7.1016 | 6.6870 | 6.3125 | 6.9731 | 4.8913 | 4.1212 | 3.9631 | 3.3198 |
| 22 | 19.660 | 17.658 | 15.937 | 14.451 | 13.163 | 12.042 | 11.061 | 10.201 | 9.4424 | 8.7715 | 8.1757 | 7.6446 | 7.1695 | 6.7429 | 6.3587 | 6.0113 | 4.9094 | 4.1300 | 3.9705 | 3.3230 |
| 23 | 20.456 | 18.292 | 16.444 | 14.857 | 13.489 | 12.303 | 11.272 | 10.371 | 9.5802 | 8.8832 | 8.2664 | 7.7184 | 7.2297 | 6.7921 | 6.3988 | 6.0442 | 4.9245 | 4.1371 | 3.9764 | 3.3254 |
| 24 | 21.243 | 18.914 | 16.936 | 15.247 | 13.799 | 12.550 | 11.469 | 10.529 | 9.7066 | 8.9847 | 8.3481 | 7.7843 | 7.2829 | 6.8351 | 6.4338 | 6.0726 | 4.9371 | 4.1428 | 3.9811 | 3.3272 |
| 25 | 22.023 | 19.523 | 17.413 | 15.622 | 14.094 | 12.783 | 11.654 | 10.675 | 9.8226 | 9.0770 | 8.4217 | 7.8431 | 7.3300 | 6.8729 | 6.4641 | 6.0971 | 4.9476 | 4.1474 | 3.9849 | 3.3286 |
| 30 | 25.808 | 22.396 | 19.600 | 17.292 | 15.372 | 13.765 | 12.409 | 11.258 | 10.274 | 9.4269 | 8.6938 | 8.0552 | 7.4957 | 7.0027 | 6.5660 | 6.1772 | 4.9789 | 4.1601 | 3.9950 | 3.3321 |
| 35 | 29.409 | 24.999 | 21.487 | 18.665 | 16.374 | 14.498 | 12.948 | 11.655 | 10.567 | 9.6442 | 8.8552 | 8.1755 | 7.5856 | 7.0700 | 6.6166 | 6.2153 | 4.9915 | 4.1644 | 3.9984 | 3.3330 |
| 36 | 30.108 | 25.489 | 21.832 | 18.908 | 16.547 | 14.621 | 13.035 | 11.717 | 10.612 | 9.6765 | 8.8786 | 8.1924 | 7.5979 | 7.0790 | 6.6231 | 6.2201 | 4.9929 | 4.1649 | 3.9987 | 3.3331 |
| 40 | 32.835 | 27.355 | 23.115 | 19.793 | 17.159 | 15.046 | 13.332 | 11.925 | 10.757 | 9.7791 | 8.9511 | 8.2438 | 7.6344 | 7.1050 | 6.6418 | 6.2335 | 4.9966 | 4.1659 | 3.9995 | 3.3332 |
| 50 | 39.196 | 31.424 | 25.730 | 21.482 | 18.256 | 15.762 | 13.801 | 12.233 | 10.962 | 9.9148 | 9.0417 | 8.3045 | 7.6752 | 7.1327 | 6.6605 | 6.2463 | 4.9995 | 4.1666 | 3.9999 | 3.3333 |